“ඇමුණුම I”

## අයදුම්පත්‍රය සහ බලපත්‍රය අංක කල යුතු ආකාරය

01. මෙහි “ඇමුණුම III” වශයෙන් ඇති ඉල්ලුම් පත්‍රයේ “අ” කොටසේ සඳහන් අයදුම්පත්‍ර අංකය බලපත්‍රය නිකුත් කරනු ලබන ආයතනය වෙත ඉල්ලුම් පත්‍රය ලැබෙන පිළිවෙලට අංක කරන්න.

02. මෙහි "ඇමුණුම් IV" හි නිකුත් කල යුතු බලපත්‍රයේ ආකෘතිය දැක්වේ. එහි සඳහන් "බලපත්‍ර අංකය (Permit Number)" අදාල බලපත්‍රය නිකුත් කිරීමේදී පහත පරිදි නිවැරදිව අංක කරන්න.

03 . ඉහත සඳහන් “ බලපත්‍ර අංකය” කොටස් හතකින් සමන්විත වේ. එහි 01, 02, 03 සහ 05 කොටස් වල සඳහන් අංක වෙනස් නොකල යුතු අතර අදාල බලපත්‍රය නිකුත් කරනු ලබන ආයතනය මගින් එම අංකයේ 04, 06 සහ 07 වන කොටස් පහත පරිදි සම්පූර්ණ කර බලපත්‍රය නිකුත් කල යුතුය.

i. **හතර වන කොටස**

මෙහි “ඇමුණුම් II” හි සඳහන් පරිදි තම ආයතනයට අදාල “සංකේත අංකය” ඇතුලත් කරන්න.

*උදා: ලෙස ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිකුත් කරනු ලබන බලපත්‍රවල මෙම සංකේත අංකය “122” වේ.*

ii. **හය වන කොටස**

බලපත්‍රය නිකුත් කරනු ලබන දිනයට අදාල වර්ෂයේ අවසන් ඉලක්කම් දෙක මෙහි ඇතුලත් විය යුතුය.

*උදා. ලෙස 2016 වර්ෂයේ නිකුත් කරනු ලබන බලපත්‍ර වල මෙම අංකය “16”වේ. 2017 වර්ෂයේදී නම් එම අංකය “17” වේ.*

iii. **හත් වන කොටස**

අදාල බලපත්‍රය **නිකුත්** කරනු ලබන පිළිවෙල (ඉල්ලුම් පත්‍රය ලැබෙන පිළිවෙල නොවේ) අනුව ඉලක්කම් හතරකින් යුක්තව සඳහන් කරන්න.

*උදා. ලෙස පළමුව නිකුත් කරනු ලබන බලපත්‍රයේ අංකය “0001” වේ. හත්වන බලපත්‍රය නම් එය “0007” වේ.*

05. කිසියම් හේතුවක් මත “ඇමුණුම් II" හි සඳහන් ආයතන වල නමෙහි වෙනසක් වන්නේ නම් (උදාහරණ ලෙස: අළුතින් අමාත්‍යාංශයක් ඇති කිරීම, දැනට තිබෙන ආයතන 2 ක් හෝ වැඩි ගණනක් එකතු කිරීම වැනි) එවැනි අවස්ථාවකදී බලපත්‍ර නිකුත් කිරීමට ප්‍රථම අදාල ආයතන ප්‍රධානියා / ප්‍රධානීන් විසින් වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලිඛිත ඉල්ලීමක් කර නව "සංකේත අංකයක්" තම ආයතනය වෙනුවෙන් ලබා ගත යුතු වේ. එවැනි ඉල්ලීමක් ලද විට අදාල වෙනස් වීම සලකා බලා සංශෝධිත "සංකේත අංකයක් " හෝ නව "සංකේත අංකයක් " අදාල ආයතනය වෙනුවෙන් ලබා දෙනු ඇත. එවිට එම බලපත්‍ර නිකුත් කල යුත්තේ නව අංකය යොදා ගනිමිනි.